# Abstract No 84

## පාලි සූත්‍රයන්හි නිරවද්‍යාර්ථ සූචනය සඳහා සංස්කෘත භාෂාධ්‍යයනයේ උපයෝගිතාව:
## මහාසමයසූත්‍රය හා මහාසමාජසූත්‍රය ආශ්‍රයෙන් සිදුවන ශාස්ත්‍රීය අධ්‍යයනයක්

**පූජ්‍ය ලේල්වල අරියධම්ම හිමි**
ආරාධිත දේශක, බෞද්ධ හා පාලි අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
ven.ariyadhamma@yahoo.com

අට්ඨකථාවන්ගේ ප්‍රමුඛ කාර්‍යභාරය වන්නේ පාලි ත්‍රිපිටකයෙහි දුරවබෝධ අර්ථ සූචනය යි. විවිධ අර්ථ සංවර්ණන ක්‍රම භාවිත කරමින් එම කාර්යය සිදුකොට ඇතත් ඇතැම් වැදගත් පාලි සූත්‍ර පාඨයන්හි නිරවද්‍යාර්ථ සූචනය අට්ඨකථා මගින් විධිමත් අයුරින් සිදු වී ඇත් ද යන්න ශාස්ත්‍රීය අධ්‍යයනයක් මගින් නිරාවරණය කළ යුතු ව ඇත. මධ්‍ය ඉන්දු ආර්ය භාෂාවක් වශයෙන් ගැණෙන පාලි භාෂාව ශාස්ත්‍රීය අධ්‍යයනයට නතු කිරීමේ දී සංස්කෘත භාෂාව විෂයයෙහි පර්යේෂකයා සතු විය යුතු පරිචය ප්‍රධාන සාධකයක් වේ. ත්‍රිපිකයේ ඇතැම් වචන සඳහා අට්ඨකථාවන් මගින් ප්‍රදානය කොට ඇති අර්ථ විවරණ මගින් ඒවාට හිමි විය යුතු තථ්‍ය දාර්ශනික අර්ථයන් සූචනය නො වන බව කේ. ආර්. නෝර්මන් විසින් පෙන්වා දී ඇත. (Norman, K., R., 1997, **A Philological Approach to Buddhism**, London) ඓතිහාසික ව්‍යාකරණයට අනුගත ව පාලි සූත්‍රාගත පද හා පාඨයන්ට විවරණ සැපයීමට පාලි අට්ඨකථාකරුවන් යොමු නොවීම මෙයට ප්‍රමුඛ හේතුවක් බව ප්‍රකට වේ. අධ්‍යයන ක්ෂේත්‍රයේ පහසුව සඳහා මෙහි දී දීඝනිකායේ මහාසමයසූත්‍රය මෙන් ම සුමංගලවිලාසිනී අට්ඨකථාවේ යථෝක්ත සූත්‍රය සඳහා වන අර්ථවර්ණනය ද සංස්කෘත භාෂාවෙන් සුරක්ෂිත වී ඇති මහාසමාජසූත්‍රය ද මුඛ්‍ය අවධානයට යොමු කරමින් ඉහත සඳහන් කළ තත්ත්වය නිරීක්ෂණය කිරීම මෙහි අපේක්ෂාවයි. තව ද වෛදික, සම්භාව්‍ය සහ මිශ්‍ර යන සංස්කෘත භාෂා ස්තරයන්ට අයත් ප්‍රාමාණික මූලාශ්‍රය වෙතට ද සම්භාව්‍ය මෙන් ම නූතන ඉන්දු ආර්ය භාෂා කෝෂ ග්‍රන්ථයන් මෙන් ම ඉංග්‍රීසි හා සිංහල භාෂාවන්ගෙන් සම්පාදිත ශාස්ත්‍රීය කෘතීන් වෙතට ද මෙම අධ්‍යයනයේ දී යථෝචිත ව අවධානය යොමු වේ. මහාසමය සහ මහාසමාජ සූත්‍රද්වය තුලනාත්මක ව පරීක්ෂාවට ලක්කිරීමේ දී මහාසමයසූත්‍රාගත පද හා පාඨ විග්‍රහ කරන අට්ඨකථා විවරණයන්හි විද්‍යමාන වන ඇතැම් සන්දිග්ධතාවන් මග හරවා ගත හැකි අතර ම අට්ඨකථාව දක්වන විවරණවල නිරවද්‍යතාව ද මැනවින් තහවුරු කරගත හැකි ය. මෙසේ පාලි සූත්‍රයන්හි නිරවද්‍යාර්ථ සූචනයෙහි ලා සංස්කෘත භාෂාධ්‍යයනයෙහි උපයෝගිතාව මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් සාකච්ඡා කෙරේ.

**ප්‍රමුඛපද -:** මහාසමාජ, මහාසමය, ජ්වල, ජල, උමා පුෂ්පනිවාසිනී, උම්මාපුප්ඵනිභාසිනො.